# 4 ආරාමයේ නිර්මාණය

අපේ රටේ සංස්කෘතිය, සාරධර්ම හැඩගැස්වීමෙහි ලා බුදුදහම විසින් කරන ලද කාර්යභාරය සුවිශාල ය. මහින්දාගමනයත් සමග ලද දහමත්, භාෂාවත්, කලා ශිල්ප ආදියත් සිංහල ජන ජීවිතය පුබුදුවා ලී ය. වැව යි, දාගැබ යි යන තේමාව මත හැඩගැසුණු දේශීය සංස්කෘතියට පදනම වූයේ බෞද්ධ විහාරස්ථානය යි. මේ පාඩම බුදුදහම පැමිණීමෙන් පසු ආරාමය වැනි අංග නිර්මාණය වී විකාශනය වීම පිළිබඳව මුල් අවස්ථාව හා සම්බන්ධ වේ. මහාචාර්ය වල්පොළ රාහුල හිමියන්ගේ 'ලක්දිව බුදුසමයේ ඉතිහාසය' කෘතියෙහි පරිච්ඡේදයක් ඇසුරෙන් මේ කොටස උපුටා ගැනිණි.

බුදුදහම රජයේ හා වැසියන්ගේ ආගම බවට පත් වූ පසු භික්ෂූන්ට ජනාවාසයෙන් දුර බැහැර ගිරිමුදුන්වල හා වනාන්තරවල පිහිටි පාළු ගල්ගුහාවල හා පන්සල්වල වැඩ වසන්ට ඉඩ දෙන්ට නොහැකි විය. මක් නිසා ද යත්, එවිට සිවුපසය සපයමින් උන් වහන්සේලා නඩත්තු කළ වැසියාට භික්ෂූන්ගෙන් ඉටු විය යුතු අවවාද අනුශාසනාදි කටයුතු අතපසු වන බැවිනි. එහෙයින් ගිහි පැවිදි ආශ්‍රය පහසුවෙන් නොකඩවා පවත්වා ගත හැකි වන පරිදි, සශ්‍රීක නගර හා සරුසාර ගම් අසල ආරාම පහළ වන්නට විය.



ථූපාරාමය

ලංකාවෙහි පළමුවෙන් ම පහළ වුණු ආරාමය අනුරාධපුර මහමෙවුනා උයනෙහි දෙවනපෑතිස් රජු කරවූ තිස්සාරාමය යි. පසු කලෙක මහාවිහාරය බවට පෙරළුණේ මේ ආරාමය යි. මුල දී මෙහි වූයේ භික්ෂු ආවාසය සඳහා කරවන ලද කාලපාසාද පිරිවෙණ නම් මැටි ගෙයක් පමණ ය. පසු විටෙක, රජු හා ඇමතියන් විසින් භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා මහමෙවුනා උයනෙහි තවත් ගෙවල් කිහිපයක් සාදවන ලදි. චෛත්‍යය ලංකාවේ ආරාමයක අංගයක් බවට පත් වුණේ ථූපාරාමය කරවීමෙන් පසු ය. බෝධිය ද එහි ම අංගයක් වූයේ බුද්ධගයාවෙන්



රුවන්වැලිමහා සෑයේ ඇතුළු මළුව

වැඩම කරවූ ශ්‍රී මහා බෝධි ශාඛාව මහමෙවුනා උයනෙහි රෝපණය කිරීමෙන් පසු ය.

සිද්ධීන් දෙක ම වූයේ දේවානම්පියතිස්ස සමයෙහි දී ය. මේ කාලයේ දී ම රුහුණු රටෙහි ද දිවයිනේ සෙසු පළාත්වල ද විශාල ආරාම පහළ වෙන්ට පටන් ගති. ක්‍රි. පූ. දෙවන ශත වර්ෂය වන විට, දුටුගැමුණු කාලයේ දී ප්‍රාසාද ගණනාවකින් සැදුණු අනුරාධපුර මහා විහාරය භික්ෂූන් රාශියකට වාසස්ථානය විය. අභයගිරිය හා ජේතවනය අනුරාධපුරයෙහි පිහිටි තවත් ප්‍රධාන ආරාම දෙකකි. මේ දෙකින් අභයගිරිය ක්‍රි. පූ. පළමු වන ශතවර්ෂයේ දී ද ජේතවනය ක්‍රි. ව. සිවු වන ශතවර්ෂයේ දී කරවන ලද්දේ විය.

සංඝාවාසයකට සාමාන්‍යයෙන් ව්‍යවහාර වුණේ 'ආරාම' නැත හොත් 'විහාර' යන මේ නම ය. ක්‍රි. ව. පස් වන ශතවර්ෂයෙහි පිළිගත් මතය පරිදි යටත් පිරිසෙයින් සතර රියනක පන්සලක් පවා, එහි චෛත්‍යයක් ඇතොත්, එහි බණ ඇසීම වෙතොත්, සිවු දිගින් පැමිණෙන මහණුන්ට, අවසරයක් නැතිව ද එහි පා සොදා, යතුරෙන් දොර ඇර, සෙනසුන් පිළියෙල කොට, ලැගුම් ගෙන, සිතුමනාපයට පිට වී යන්ට ලැබෙතොත්, ඇත්තෙන් ම "සිවු දිගින් පැමිණෙන භික්ෂූන් සඳහා" කරවන ලද විහාරයකි.

විහාරයකට අවශ්‍ය ම අංග නම් චෛත්‍යයත් ලැගුම්ගෙය හා ධර්ම දේශනා කිරීමත් බව මේ වගන්තියෙන් පෙනේ. එනමුත් සම්පූර්ණ ආරාමයක දොරටුවෙහි දොරටු පැන් මඩිය නම් ගොඩනැගිල්ලක් තිබුණේ ය. මේ වනාහි පැන් කළ තබා තිබූ තැන යි. මෙසේ පැන් කළ තබා තිබුණේ සිද්ධස්ථානයට පිවිසෙන්නට පෙර වන්දනාකරුවන්ට අත් දෝවන කිරීමට, මල් වට්ටියට පැන් ඉසීමට හා බීමට බව සිතිය හැකි ය. ජේතවනාරාමයෙහි දොරටු පැන් මඩිය තරමක් විශාල දෙමහල් ගොඩනැගිල්ලක් විය. කිසි ම ආගන්තුකයකුට ගොඩනැගිල්ලෙහි උඩුමහලෙහි වත් යටිමහලෙහි වත් පැන් කළ සඳහා වෙන් වුණු තැන වත් නැවතී සිටීමට ඉඩ නො දිය යුතු යැ යි නියමයක් කර තිබුණේ ය. මේ මණ්ඩපය දුර බැහැරින් පැමිණි වන්දනා නඩවලට මුහුණ, කට හා පා සෝදා ගැනීමටත් පිරිසිදු ඇඳුම් ඇඳ ගැනීමටත් හැකි වන පරිදි තරමක් ඉඩකඩ ඇති තැනක් වූ බව පෙනේ.

අනුරාධපුරයේ ඇතැම් දාගැබ්වල මළුවට ඇතුළු වන දොරටුවෙහි පියගැටපෙළ අසල කොරහක හැඩයට වළගැසුණු ගල් කුට්ටි තිබුණේ ය. අනුරාධපුරය අසල පන්කුලිය ආරාමයෙහි මෙබඳු ගල් කොරහක කොටා තිබී හමු වුණු ලිපියක මේ බඳුනෙහි නම සඳහන් වන්නේ 'පාදෝනි' යනුවෙනි. මේ නමින් ම එය කුමක් සඳහා දැ යි වැටහේ. කල්‍යාණවතී බිසවගේ රුවන්වැලි සෑ ලිපියෙහි මේ ගල් කොරහ සඳහන් වන්නේ 'පාදෙණි' යන නමිනි. 'පාදෙණි' යයි කියත හැකි, තනි ගලෙන් කෙටූ මෙබඳු 'දෝණි' ථූපාරාම ආදි ඇතැම් දාගැබ් අසල දක්නට ලැබේ. මේවායින් පෙනෙන්නේ සිද්ධස්ථානයට ඇතුළු වන්නට පෙර වන්දනාකරුවන්ට පා සෝදා ගැනීමට දිය පිරුණු ගල්දෙණි තිබුණු බවයි.



ථූපාරාමයේ කැඩී ගොස් ඇති පාදෝණි



පන්කුලිය ගල් කොරහ



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ආරාම භූමිය ඇතුළත ප්‍රධාන පූජ්‍ය වස්තුව වූයේ බුදුන් වහන්සේගේ ධාතු නිදන් කළ චෛත්‍යය හෙවත් දාගැබ යි. කුඩා චෛත්‍යයක් ගැන කෙසේ වුවත් යටත් පිරිසෙයින් රුවන්වැලි සෑය වැනි ප්‍රධාන දාගැබ් වටා මළුවක් තිබිණි. පිට මළුව, වාලිකංගණ හෙවත් වැලි මළුව නම් විය. සුදු වැලි අතුළ මේ මළුව වටා පවුරක් විය. ඊට ඉහළින් ඇතුළු මළුව අද දවසේ පවා අපට අනුරාධපුරයෙහි දක්නට ලැබෙන පරිදි ගල් ලැලි අතුරා කරන ලද්දකි. මේ මළුව වටා කයියෝරුවක් හැටියට ඇත් පවුරක් (හත්ථිපාකාර), ඒ කියන්නේ ඇත් රූපවලින් යුත් පවුරක් විය. මහ දොරටු සතරෙහි තොරණ සතරක් තිබුණේ ය.

චෛත්‍යයෙහි බුබ්බුලාකාරය නැංවුණේ 'වේදිකා භූමි' හෙවත් 'පුප්ඵාධාන' යන නමින් හැඳින්වුණු, කෙමෙන් පිහිටි තුන්මාල් පේසාව උඩ ය. මෙය සෑයේ පතුල යි. මේ තුන්මාල පේසාවෙන් ඉහළ ම පේසාව මල් පිදීමට මල් අසුන් හැටියට පාවිච්චි කරන ලද්දේ ය. මැද පේසාව පවා බාගදා මේ සඳහා ම පාවිච්චි කරන්නට ඇත. ඉහළ ම පේසාව 'කුච්ඡ වේදිකා භූමිය'යි නම් විය. පහළ ම පේසාවෙහි සෑය වටේ ම නියමිත පරතරයකට අනුව කොටන ලද පාද පීඨිකා නම් අඩි සලකුණු දහසයක් විය. මේ සලකුණුවලින් දැක්වුණේ ඉහළ පේසාවෙහි මල් පූජා කිරීමෙන් පසු සෑය පැදකුණු කරන ගමන් වන්දනාකරුවන් පසඟ පිහිටුවා වැන්ද යුතු තැන් ය. මේ මාල් පේසාවට නගින්ට පඩි පෙළවල් තිබුණේ ය.

සෑය වටා සෑගෙයක් (චේතියඝර) විය. ගල් කණු මත නැංවුණු ගොඩනැඟිල්ල සෑයට ආවරණයක් හැටියට වහලකින් ද යුක්ත විය. ඇතැම් විට දොරවල් ද සවි කොට ඇතුළෙහි ලස්සන පලස් ද අතුරා තිබුණේ ය. මේ අතින් බලන විට සෑගෙය සෑය වටා තැනූ ගෙයක් වගේ ය. ගේ ඇතුළෙහි මල් පිදීමට මල් අසුන් විය.

සෑගෙයක් කරවන ලද්දේ ථූපාරාමය හා අම්බස්ථලය වැනි කුඩා දාගැබ්වලට පමණක් බව නටබුන්වලින් පෙනේ. රුවන්වැලි සෑය හෝ අභයගිරිය හෝ ජේතවනය වැනි විශාල දාගැබ්වලට සෑගෙයක් තිබුණු බව කොතැනක වත් සඳහන් වී නැත. එවැනි දාගැබ්වලට ගෙයක් කරවීම නො කළ හැකි දෙයක් බව කාටත් වැටහෙනු ඇත. සෑගෙය සෑයට ම පමණක් නො ව, වන්දනාකරුවන්ට ද අව්වට, වැස්සට ආවරණයක් විය. සෑගෙය සෑයට රැකවරණයක් වුව ද සරලකම ම ලක්ෂණ කොට ගත් ආනුභාව සම්පන්න ශෝභාවට නම් එයින්, විශේෂයෙන් සඳ එළියෙන් බැබළුණු රාත්‍රියක දී, වුණේ බාධාවකි. ඇතැම් විට සෑය සිත්තම්වලින් අලංකාර කරන ලද්දේ විය. දෙවන අග්බෝ රජු (ක්‍රි.ව. 601-611) විසින් ප්‍රකෘති කරවීමෙන් පසු ථූපාරාමයෙහි කරවන ලද සිත්තම් මීට නිදසුනකි. සද්ධාතිස්ස රජු (ක්‍රි.පූ. 77-59) විසින් අම්බස්ථල දාගැබ මනෝසිලා හෙවත් රත්හිරියල් සුණු ගා රන් පැහැයෙන් අලංකාර කරවන ලද්දේ ය.

චෛත්‍යය හැරුණු විට ඊ ළඟට ප්‍රධාන කොට සැලකුණේ බෝධිය යි. ඇතැම් බෝධීන් 'වඩ්ඪමාන බෝධි' ආදි විශේෂ නම්වලින් හැඳින්වීමෙන් ම, මේ පූජ්‍ය වෘක්ෂයට බෞද්ධයන් දැක්වූ ආදරය, ගෞරවය කොතරම් දැ යි ඔප්පු වේ. ආරාමයක දී, බෝධියට ලැබෙන්නේ බුදුන් වහන්සේගේ ශාරීරික ධාතුන්ට ලැබෙන ගෞරවස්ථානයට පමණක් දෙවැනි වන තැනකි. බෝ ගසක අත්තක් කැපීමට අවසරය ලැබුණේ එයින් සම්බුද්ධ ධාතුන් නිදන් කොට ඇති චෛත්‍යයකට හෝ ප්‍රතිමාවකට හෝ ආසනඝරයකට හෝ බාධාවක් වූ විට පමණි; නැත හොත් දිරන හෝ දුම්මලකාරි ආදිය වැස්සෙන හෝ අත්තක් කැපීම, මිනිස් කයට සැත්කමින් සුවයක් වන්නා සේ, ගස සුව සේ වැඩීමට පිළියමක් වන්නේ නම්

පමණි. අත්තක වසන කුරුල්ලන් සෑය මත වසුරු හෙළතොත් එවිට ද අත්තක් කැපීමට අවසරය තිබිණි. එහෙත් වෙන මොන ම කරුණක් නිසා වත් බෝ අත්තක් කැපීම තහනම් විය.

බෝ මළුවක සතර දිසාවෙහි තොරණ සතරක් ද බෝධිය වටා වේදියක් හෙවත් උස් ගල් මළුවක් ද විය. වන්දනාකරුවන් බෝධිය වඳින්ට දණ ගැසුවේ මේ ගල් මළුවෙහි ය. බෝධියට ඊට වඩා කිට්ටුවෙන් බෝධිඝරය හෙවත් බෝගෙයක් විය. මේ ගෙය සාදන ලද්දේ, සෑගෙය මෙන් උඩින් නො ව, අතුවලට පහතින් ගස වටේ ය. ඇතැම් විට බෝගෙය තුළ බුදුපිළිමයක් ද විය. සෑගෙය මෙන් ම මේ ගෙය ද බෝධිය පැදකුණු කළ ශ්‍රද්ධාවන්තයන්ට ආරක්ෂාව දීමේ අදහසින් තැනුවා විය හැකි ය.

වැදගත්කමින් ඊළඟට සැලකෙන්නේ බුදු පිළිමය තැන්පත් කර තිබූ පටිමාඝර හෙවත් පිළිම ගෙය යි. පිළිම ගෙය ලංකාවේ ආරාමයක අංගයක් වූයේ කවර කලක දී ද යනු මෙහි දී විමසිය යුතු කරුණකි. මහා විහාරය සඳහා මිහිඳු මා හිමියන් සැපයූ සැලැස්මෙහි මහාථූපය හා මහාබෝධිය පිහිටුවීමට සුදුසු තැන් නියම කරන ලද්දේ මුත් පිළිම ගෙයක තැනක් නියම නො වී ය. ක්‍රි. පූ. තෙවන ශතවර්ෂයේ අසෝක කාලයේ දී බුදු පිළිම තිබුණු බවක් දැන ගන්ට නැති බව මෙහි දී සිහි කට යුතු ය. සාංචියෙහි සහ භාරුත්හි පැරණි කැටයම්වල බුදු පිළිමයක් දක්නට නැත. මෙහි දී බුදුන් වහන්සේ පෙනෙන්ට සිටිය යුතු ම යයි නිසැකයෙන් ම සැලකිය හැකි දර්ශනවල දී පවා, උන් වහන්සේ නිරූපණය වන්නේ සිරිපා සටහනක් හෝ චක්‍රයක් හෝ මල්මාලා පලන් සේසතකින් යට සෙවණ වුණු ආසනයක් වැනි සංකේතයකිනි. භාරුත්හි කැටයම්වල එක් දර්ශනයක දී අජාසත් රජු සිරිපා සටහන ඉදිරියේ දණ



මිහින්තලේ අම්බස්තල චෛත්‍යය



සීගිරියේ බෝධිඝරය



තිවංක පිළිමගෙය



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ගසා සිටිනු දැක්වේ. එහෙත් එහි සඳහන් ලිපියෙන් "අජාතශත්‍රැ බුදුන්ට නමස්කාර කරයි" යනුවෙන් නිශ්චිත ලෙස ම කියැවේ. දඹදිව් වැසියන් බුදු පිළිම සෑදීමට හා වැඳීමට පටන් ගත්තේ අසෝක සමයෙන් මෑත කාලයක බව ඔප්පු වන නිදසුන් රැසක් ම ඇත.

## අවබෝධය

1. සශ්‍රීක නගර හා සරුසාර ගම් අසල ආරාම ඉදි වීමට තුඩු දුන් හේතුව කුමක් ද?
2. "සිද්ධීන් දෙක ම වූයේ දේවානම්පියතිස්ස සමයේ දී ය" මේ ප්‍රකාශයේ දැක්වෙන සිදුවීම් දෙක සඳහන් කරන්න.
3. සිවු දිගින් පැමිණෙන භික්ෂූන් සඳහා කරවන ලද විහාරයකට අත්‍යවශ්‍ය අංග තුන නම් කරන්න.
4. පැන් මඩිය, පාදෙණිය යන නම්වලින් හඳුන්වනු ලබන ආරාම අංග දෙකෙහි කාර්යභාරය දක්වන්න.
5. බෝ ගසක අත්තක් කැපීමට අවසර ලැබුණේ කවර අවස්ථාවන්හි ද?

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන වචන සඳහා යෙදෙන සිංහල වචන පාඩමෙන් උපුටා ලියන්න.**

| | |
|---|---|
| i. වාලිකංගණ | v. පුප්ඵාධාන |
| ii. බෝධිඝර | vi. චේතියඝර |
| iii. හත්ථිපාකාර | vii. පාද පීඨිකා |
| iv. පටිමාඝර | viii. ශ්වේත ඡත්‍රය |

2. **මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන වචනය තෝරන්න.**

i. මිදුල - මළුව, මාලකය, අංගණය, එළිමහන
ii. ගෘහය - මාළිගාව, ගෙය, ඝරය, නිවාසය
iii. ස්තූපය - චෛත්‍යය, ආරාමය, දාගැබ, සෑය
iv. ප්‍රාකාරය - පවුර, පරික්ෂේපය, කොටුව, තාප්පය
v. කන්ද - ගිර, උච්චය, පව්ව, පර්වතය

3. **පහත දැක්වෙන පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.**

| | |
|---|---|
| i. විවේකී | ii. සාමාන්‍යයෙන් |
| iii. ආගන්තුක | iv. සශ්‍රීක |
| v. ආශ්‍රය | vi. ඇතුළත |
| vii. පෑළදිග | viii. ජනශූන්‍ය |

# සාම්ප්‍රදායික යෙදුම්

භාෂාව සංස්කෘතික මෙවලමකි. සමාජයක වසන ජනයාගේ ජීවනෝපාය, සිරිත් විරිත්, සිතුම් පැතුම්, ඇදහිලි හා ආකල්ප මත භාෂාව ගොඩනැගේ. භාෂාවේ ඇතැම් වචන හා යෙදුම් කාලයක් තිස්සේ ව්‍යවහාර වීම නිසා වාච්‍යාර්ථය ඉක්මවන අමුතු අර්ථ ඒවාට ආරෝපණය වෙයි. ඒවා සාම්ප්‍රදායික යෙදුම් ලෙස සැලකේ. සිංහල භාෂාවේ ව්‍යවහාර වන යුගල පද, රූඪි හෙවත් ඉඟි වැකි හා ප්‍රස්තාව පිරුළු මෙබඳු ව්‍යවහාර ය.

## රූඪි හෙවත් ඉඟි වැකි

**පහත දැක්වෙන වාක්‍ය යුගල දෙස බලන්න.**

අවුරුදු උලෙළේ පැවති **කඹ ඇදීමේ** තරගයෙන් අපි ජයග්‍රහණය කළෙමු.
දෙපිරිස අතර වූ **කඹ ඇදීමේ** ප්‍රතිඵලයක් වශයෙන් මාර්ගයේ අලුත්වැඩියාව ඇණහිට ඇත.

මුල් වැකියෙහි 'කඹ ඇදීමේ' යන්න යෙදී ඇත්තේ 'කඹ ඇදීම' නම් ක්‍රීඩාව දැක්වීම සඳහා ය. එය වාච්‍යාර්ථය යි.

දෙවැනි වැකියෙන් එසේ නො වේ. එහි ඇත්තේ එකඟතාවක් නැතිකම යන ආරෝපිත අරුතකි.

මේ අනුව රූඪි හෙවත් ඉඟි වැකි මගින් පළ වනුයේ වාච්‍යාර්ථය මත ආරෝපණය වූ අමුතු අරුතකි. කතා කිරීමේ දී මෙන් ම ලිවීමේ දී අදහස් රසවත් ව හා සිත් ගන්නා සේ ඉදිරිපත් කිරීමට මේ යෙදුම් උදවු වේ. මේ එබඳු යෙදුම් කිහිපයකි.

| | |
|---|---|
| දෙහි කැපුවා | - බැණවැදුණා |
| අත්වැල් බැඳ ගෙන | - එකට එක් වී |
| කණකොකා හඬලා | - විනාශය ළං වෙලා |
| කුඩම්මාගේ සැලකිල්ල | - වෙනස්කම |
| හය හතර නොදන්නා | - දැනුම් තේරුම් නොමැති |
| කරබා ගෙන | - නිශ්ශබ්ද ව |
| කජු කන්නා සේ | - ඉතා පහසුවෙන් |
| හමස් පෙට්ටියට යෑම | - ක්‍රියාත්මක නොවී තිබීම |
| කැලෑ නීතිය | - බලවතා දුබලයා පෙළීම |
| හුඹස් බිය | - අස්ථාන බිය |
| මර ඇඳේ | - අන්තිම අවස්ථාවේ |
| අඟින් කිරි දෙවීම | - නිෂ්ඵල කාර්යයක් කිරීම |
| පටි කැඩුණා | - ගෞරවය කෙලෙසුණා |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ප්‍රස්තාව පිරුළු

අතු කඩා මොර කන්නා සේ
පරංගියා කෝට්ටේ ගියා සේ
දීකිරට බළල්ලුත් සාක්කි ලු

භාෂාවක සජීව බව, ඕජෝ ගුණය පළ කෙරෙන මෙවැනි සාම්ප්‍රදායික යෙදුම් 'ප්‍රස්තාව පිරුළු' නම් වෙයි. ප්‍රස්තාව පිරුළු යන්නෙහි 'ණයට ඉල්ලා ගත් දේ' යන අරුත් ගැබ් වෙයි. ඒ අනුව අතීතයේ විසූ අපේ පැරැන්නන්ගෙන් ණයට ගත් මේ භාෂාත්මක ව්‍යවහාර සමාජයේ විවිධ අවස්ථාවල දී භාවිතයට ගැනේ. කතාවේ දී හා ලේඛනයේ දී අදහසක් වඩාත් රසවත් ව අර්ථවත් ව පළ කිරීම සඳහා ප්‍රස්තාව පිරුළු උදවු වේ.

ප්‍රස්තාව පිරුළු බොහෝ විට ඓතිහාසික සිදුවීමක්, ජනකතාවක්, පුරාවෘත්තයක්, පුද්ගල චරිතයක් හෝ සමාජ සංසිද්ධියක්, සතුන්ගේ චර්යාවක් හෝ පරිසරය නිරීක්ෂණයෙන් දැක්වෙන දෙයක් ඇසුරෙන් උපන් කියමනකි. මේ එබඳු පිරුළු කිහිපයක් හා ඒවා යොදා ගත හැකි අවස්ථා ය.

| පිරුළ | අවස්ථාව |
|---|---|
| වඳින්න ගිය දේවාලේ හිස මත කඩා වැටුණා වගේ | පිහිටක් පතා ගිය තැනින් විපතක් සිදු වීම |
| උපන් ගෙයි සිරිත බලි ඇරියත් යන්නෙ නැතිලු | ජන්මයෙන් ආ දුර්ගුණ ඉවතලිය නොහැකි බව |
| දීකිරට බළල්ලුත් සාක්කිලු | වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම |
| කැලේට පායපු හඳ වගේ | අගයක් නොමැති වීම |
| එපා වාහෙට හොදි බෙදන්නා වගේ | පිළිකුලෙන් හෝ නොසැලකිල්ලෙන් සැලකීම |
| උඩින් මිතුරු යටින් හතුරු | බොරුවට මිතුරුකම් පෙන්වමින් රහසින් හතුරුකම් කිරීම |
| අතු කඩා මොර කන්නා සේ | අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම |
| ඌරෝ කවද ද කහ කෑවේ? | අධමයන්ට උතුම් දෙයක් පලක් නැතිකම |
| කළුවා මාරපන් ගියා වගේ | අරමුණකින් තොර ව වැඩ කිරීම |
| පුංචි අම්මාත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ | විශාල බලාපොරොත්තුවක් ඇති ව සිටිය ද ප්‍රතිඵලය අල්ප වීම. |
| කලක දි වහලු කලක දි රස වෙනවා ලු | කලක් සතුරු ව සිටි අය පවා පසු ව මිතුරන් වන බව |
| අලි මදිවට හරක් | එක් කරදරයක් පිට තවත් කරදරයක් ඒම |

## යුගල පද

පද දෙකක් එක ළඟ යෙදී තනි අරුතක් ප්‍රකාශ කරන ඉඩ කඩ, අය වැය, කෙළි සෙල්ලම්, වැනි යෙදුම්, යුගල පද ලෙස හැඳින්වේ.

ඇතැම් යුගල පදවල පද යුගල අර්ථයෙන් සමාන වේ.

වාද භේද
ගරු නම්බු
හුරු පුරුදු

ඇතැම් යුගල පදවල පද යුගල අර්ථයෙන් සමාන නොවේ.

යන එන
කන කර
බාල මහලු

ඇතැම් යුගල පදවල එක් පදයක අර්ථය පැහැදිලි නැත. නමුත් එය අනෙක් පදයේ අර්ථය තීව්‍ර කිරීමට ඉවහල් වේ.

ඉඩම් කඩම්
අස් පස්
අග හිඟ

තවත් විවිධ නිර්ණායක පදනම් කරගෙන යුගල පද වර්ගීකරණය කළ හැකි ය. මේවා ලේඛනයක සාරවත් භාවය වර්ධනයට ඉවහල් වන සාම්ප්‍රදායික යෙදුම් විශේෂයකි.

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන රූඪිවලින් පළ වන අර්ථය ඉදිරියෙන් ලියන්න.**

i. ඇගේ ලේ වතුර වුණා - ........................................
ii. ඉබාගාතෙ යනවා - ........................................
iii. අබ මල් රේණුවක් වත් - ........................................
iv. අගේ ඉඳන් කන කනවා - ........................................
v. එක පතේ කෑ - ......................................
vi. ඉහ නිකට බලා - ......................................
vii. මුළු සේසත ම - ......................................
viii. දිවෙන් දිව ගාගෙන - ......................................
ix. අං ඇවිල්ලා - ......................................
x. දඩමීමා කරගත් - ......................................

2. **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවලින් පළ වන අර්ථය ලියන්න.**

i. නරියාට කුකුල් කොටුව බාර දුන්නා වගේ
ii. කබලෙන් ළිපට වැටුණා වගේ
iii. උණහපුළුවට උගේ පැටියා මැණිකලු
iv. දියකාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ
v. ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ

3. **පහත දී ඇති ප්‍රස්තාව පිරුළු යොදා වාක්‍ය තනන්න.**

i. ආඬි හත් දෙනාගෙ කැඳ හැළිය වගේ
ii. හිසරදේට කොට්ටෙ මාරු කරන්නා සේ
iii. වැල යන අතට මැස්ස ගහන්නා සේ
iv. එළ හරකයි මී හරකයි එකට ඇඳුවා වගේ
v. බැඳගත්ත බෙරේ ගහන්න ඕනෑ

4. **පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.**

| | | | |
|---|---|---|---|
| i. තෑගි | .............................. | vi. තුටු | .............................. |
| ii. අවි | .............................. | vii. අරුම | .............................. |
| iii. උදවු | .............................. | viii. ගනු | .............................. |
| iv. ඉඳුම් | .............................. | ix. ඉතින් | .............................. |
| v. ලේසි | .............................. | x. ගමේ | .............................. |